# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2396/56 – 2024 අගෝස්තු මස 09 වැනි සිකුරාදා – 2024.08.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/83 (III)

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 26 වන වගන්තිය යටතේ කෘෂිකර්ම සහ වැව්ලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර (පා.ම.),
කෘෂිකර්ම සහ වැව්ලි කර්මාන්ත අමාත්‍ය.

2024 ජූලි මස 31 වැනි දින
කොළඹ දී ය.

1A – PG 6819 – 504 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නියෝග

1. මෙම නියෝග 2024 අංක 1 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ (ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) පනතේ 6 වන වගන්තිය යටතේ සාමාන්‍ය සහ ගෘහස්ථ පළිබෝධනාශකයක බලපත්‍ර ලබාදීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම පහත දැක්වෙන ආකාරයෙන් වාරික දෙකකින් ගෙවිය යුතු රුපියල් ලක්ෂ දෙකක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතුය.

(අ) ආපසු නොගෙවන ගොනු කිරීමේ ගාස්තුවක් ලෙස රුපියල් එක් ලක්ෂ පනස් දහසක් ; සහ
(ආ) ඉල්ලුම් පත්‍රය භාර ගැනීමෙන් පසු ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ලෙස රුපියල් පනස් දහසක්.

(2) 6 වන වගන්තිය යටතේ සීමා කරන ලද පළිබෝධනාශකයක බලපත්‍ර දීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම පහත දැක්වෙන ආකාරයෙන් වාරික දෙකකින් ගෙවිය යුතු රුපියල් හතලිස් දහසක ගාස්තුවක් සමන්විත විය යුතු ය.

(අ) ආපසු නොගෙවන ගොනු කිරීමේ ගාස්තුවක් ලෙස රුපියල් විසිපන්දහසක මුදලක් ; සහ
(ආ) ඉල්ලුම් පත්‍රය භාර ගැනීමෙන් පසු ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ලෙස රුපියල් පහළොස්දහසක මුදලක්.

(3) (අ) 7 වන වගන්තිය යටතේ පළිබෝධනාශකයක බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමකට; හෝ
(ආ) 7 වන වගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක් 11 වන වගන්තිය යටතේ අවලංගු කිරීමකට, අත්හිටුවීමකට හෝ අලුත් කිරීමකට එරෙහිව,

වන සෑම අභියාචනයක් සමගම රුපියල් පනස් දහසක ගාස්තුවක් සමන්විත විය යුතු ය.

3. (1) 7 වන වගන්තිය යටතේ පළිබෝධනාශකයක් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම රුපියල් දසදහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(2) පළිබෝධනාශකයක් ලියාපදිංචි කිරීමට අරමුණු කරන යම් තැනැත්තකු හෝ වසර හයක් සම්පූර්ණ වීමෙන් පසුව ස්වකීය බලපත්‍රය අලුත් කිරීමට අරමුණු කරන යම් බලපත්‍ර දරන්නකු විසින්, රජයේ පර්යේෂණ ආයතනයකින් ජෛව සඵලතා නියාමක ක්ෂේත්‍ර අධ්‍යයන සහතිකයක් ලබා ගැනීමට රුපියල් හැත්තෑපන්දහසක මුදලක් ගෙවිය යුතු ය.

(3) ආහාර භෝග සඳහා පළිබෝධනාශකයක් ලියාපදිංචි කිරීමට අරමුණු කරන යම් තැනැත්තකු, 20 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි අවශිෂ්ට විශ්ලේෂණ නියාමක පරීක්ෂණයක් මත සහතිකයක් ලබා ගැනීමට රුපියල් ලක්ෂ දෙකක මුදලක් ගෙවිය යුතු ය.

4. සාමාන්‍ය, ගෘහස්ථ සහ සීමා කරන ලද පළිබෝධනාශක පිළිබඳ 6 වන වගන්තිය යටතේ නිකුත් කළ බලපත්‍රයක් සංශෝධනය කිරීම සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම රුපියල් පන්දහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

5. යම් ලියාපදිංචි පළිබෝධනාශකයක් ආනයනය කිරීමට අවශ්‍ය යම් තැනැත්තකු, බලපත්‍ර ගාස්තුවක් ලෙස රුපියල් දෙදහසක මුදලක් ගෙවා 17 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

6. (5) වන නියෝගය යටතේ නිකුත් කළ ලිඛිත අනුමැතිය දීර්ඝ කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් සමගම රුපියල් පන්සියයක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

7. (1) 6 වන වගන්තිය යටතේ ප්‍රථම වතාවට පළිබෝධනාශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක, සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, ඇතැම් ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී හෝ බෙදා හැරීමේදී තුන්වන පාර්ශ්වයන්ගේ පරිසරයේ සහ වනජීවී සම්පත්වල ආරක්ෂාවට කිසිදු උපද්‍රව්‍යයක් නොවිය යුතු බවට සහතික කරන ක්ෂේත්‍ර ඇගයීමක් රෙජිස්ට්‍රාර්වරයාගේ ලබා ගත යුතු ය.

(2) (1) වන උපනියෝගය යටතේ ක්ෂේත්‍ර ඇගයීමක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් පහත දැක්වෙන ආකාරයෙන් වාරික දෙකකින් ගෙවිය යුතු රුපියල් ලක්ෂ දෙකක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(අ) ආපසු නොගෙවන ගොනු කිරීමේ ගාස්තුවක් ලෙස රුපියල් ලක්ෂයක මුදලක් ; සහ

(ආ) ක්ෂේත්‍ර ඇගයීම කිරීමෙන් පසු සහ ඉල්ලුම් පත්‍රය භාර ගැනීමෙන් පසුව ලියාපදිංචි ගාස්තුවක් ලෙස රුපියල් ලක්ෂයක මුදලක්.

එසේ වුව ද, යම් සීමා කරන ලද පළිබෝධනාශකයක් ආනයනයකරන්නෙකු (1) වන උපනියෝගය යටතේ ක්ෂේත්‍ර ඇගයීමක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශන කමිටුවේ අනුමැතියට යටත්ව, නිදහස් කරනු ලැබිය හැකි ය.

8. 1 වන තීරයේ දක්වා ඇති පරීක්ෂණ පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ රසායනඥයකුගේ විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමට අරමුණු කරන යම් පළිබෝධනාශක ආනයනකරුවකු, නිෂ්පාදකයකු, සංයෝජකයකු හෝ ඇසුරුම්කරුවකු විසින් ඒ පරීක්ෂණ සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර ඒ සමඟ II තීරයේ දක්වා ඇති අනුරූප ගාස්තු ඉදිරිපත් කළ යුතු ය.

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| පළිබෝධනාශක සාම්පලයක ඝනත්වය සඳහා පරීක්ෂාව | රු. 500.00 |
| පළිබෝධනාශක සාම්පලයක පෙණ පැවතීම සඳහා පරීක්ෂාව (නොනැසී පවතින) | රු. 500.00 |
| පළිබෝධනාශක සාම්පලයක තෙත්කාරක හැකියාව සඳහා පරීක්ෂාව | රු. 500.00 |
| පළිබෝධනාශක සාම්පලයක pH අගය සඳහා පරීක්ෂාව | රු. 500.00 |
| පළිබෝධනාශක සාම්පලයක තෛලෝද ස්වාධීනතාවය සඳහා පරීක්ෂාව | රු. 500.00 |
| පළිබෝධනාශක සාම්පලයක සක්‍රීය සංඝටකයක ප්‍රමාණය සඳහා පරීක්ෂාව | රු. 7,000.00 |
| පළිබෝධනාශක සාම්පලයක විෂද්‍රව්‍යකයක ප්‍රමාණය සඳහා පරීක්ෂාව | රු. 10,000.00 |
| පළිබෝධනාශක සාම්පලයක බැර ලෝහ ප්‍රමාණය සඳහා පරීක්ෂාව | රු. 8,000.00 |

9. පද සම්බන්ධයෙන් අනාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, -

"පනත" යන්නෙන්, 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත අදහස් වේ;

"ජෛව සඵලතා නියාමක ක්ෂේත්‍ර අධ්‍යන සහතිකය" යන්නෙන්, පළිබෝධ පාලනයේදී පළිබෝධනාශකයක කාර්යක්ෂමතාවය දක්වන අදාළ රජයේ පර්යේෂණ ආයතනයක් විසින් නිකුත් කළ සහතිකයක් අදහස් වේ;

"රජයේ පර්යේෂණ ආයතනය" යන්නෙන්, භෝග පිළිබඳ පර්යේෂණයට හා සංවර්ධනයට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවන ලද ආයතනයක් අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්" යන්නෙන්, පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

10. 1983 සැප්තැම්බර් 22 වන දින අංක 263/17 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඒ යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 08-0119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.